අත ගැලවී එල්ලි එල්ලී තිබියදීත්
පෙරලුණු බසයේ සිටි සයමස් සිඟිත්තියට
අම්මෙක් වූ වයඹ සරසවියේ නිෂානි

නිෂානි රත්නායක විසින් බේරාගත් සිඟිත්තිය ප්‍රතිකාර ලබාගන්නා අයුරු

නිෂානි රත්නායක ශිෂ්‍යාවගෙන් අගමැතිවරිය කරුණු විමසන අයුරු

ඇයගේ මව ඇය අසල ගම්පොළ රෝහලේ සිටින ආකාරය

ගම්පොළ සමූහ - සුරංග දිල්හාන්

ගම්පොළ නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ රම්බොඩ දී ප්‍රපාතයට පෙරලුණු කතරගම බස් රථයේ සුන්බුන්වලට යටවී සිටි මවක් සිය කිරිකැටි දරුවාව අත් නොහැර රැකවරණය දුන්නේ තම ජීවිතය අනතුරේ බව දැන දැන දැනය. ඒ සිය ජීවිතයට වඩා දාරක ස්නේහය මෙන්ම දරු රැකවරණය උතුරා යන්නට වූ නිසාමය. ඒ අම්මාවරුන්ය. මේ කියන්නේ එවන් අම්මාකෙනකුගේ ස්නේහය කැටිකොටගත් තරුණ දියණියක් ගැනය.

ඇය, පෙරේදා (11) අලුයම කොත්මලේ රම්බොඩ ගෙරඬිඇල්ලේදී පෙරලුණු කතරගම බස් රථයේ සිටි වයඹ විශ්ව විද්‍යාලයේ සිසුවියකි. මෙම බිහිසුණු අනතුරින් ඇගේ අත උරහිසින් ගැළවී එල්ලී එල්ලී තිබියදීත් වේදනාව දරාගත නොහැකිව කෙදිරිගාමින් සුන්බුන් අතරින් එළියට ඇදෙද්දී ඇයට කවුරුන් දෝ කෙනෙක් අමතනු ඇසිනි. "මේ ළමයා වඩා ගන්න" එම පුද්ගලයා ඇයට කියයි. තමන්ට සිදුව තිබූ දේ ඇෑ නාදුනන්නාට කීවත් ඔහුද හිටියේ කෙදිරිගාමින් දෙළොවක් අතරය. රෙදිවලින් අවරණය කර සිටි මේ කිරිකැටියා ඉවත හෙළීමට ඇගේ හිත ඉඩක් නොදුන්නේය. අවසානයේදී කිරිකැටියා එක්අතකින් තුරුළුකරගත් ඇය තමන් බේරාගැනීමට කවුරුන් හෝ එනතුරු ෂන කරුවලේ දෑස් දල්වා බලා සිටියාය.

ඇය, නමින් නිෂානි නාමල් රත්නායකය. ඇය වයඹ විශ්වවිද්‍යාලයේ භෝග කළමනාකරණ පීඨයේ දෙවන වසරේ ඉගෙනුම ලබමින් සිටින්නීය. බදුල්ල හිඳගොඩ පදිංචි නිෂානි, නිවෙසේ සිට යළි විශ්වවිද්‍යාලයට යෑම සඳහා ඉකුත් (11) වැනිදා රාත්‍රියේ කතරගම්න් පැමිණෙන මෙම බස් රථයට ගොඩවන්නේ විශ්ව විද්‍යාලයේ විභාගයට පෙනී සිටීමේ අරමුණිනි. සුපුරුදු පරිදි ඈ සමඟ බණ්ඩාරවෙලින් මෙම රථයට ගොඩවන තවත් මිතුරකු ද සිටියේය. දෙදෙනාම විභාගය වෙනුවෙන් යමින් සිටිද්දී මෙවන් බිහිසුනු අනතුරක් සිදුවෙතැයි සිතන්නටවත් නැත.

තමන් අත්දැකි ඒ සිදුවීම ඈ, අපට මෙසේ කීවාය.

''මම බස් එකේ මැද හරියේ වාඩිවෙලා හිටියේ. එකවරම බස් එක ඇළවෙලා පෙරළෙන්න පටන් ගත්තා. රවුම් දෙකක් විතර යනකොට මම විසිවෙලා ගියා. ඊට පස්සේ යකඩ ගොඩකට හිරවුණා. මගේ ඔළුව වදියි කියලා මම ගුලි වෙලා ඔළුව පහළට හරවාගෙන හිටියේ. බස් එක පෙරළිලා නතර වුණාට පස්සේ මම නැඟිටින්න උත්සාහ කළා. මගේ ඇඟම හිරි වැටිලා තිබුණේ. අත උස්සන්න බැරි වුණා. මගේ දකුණු අත නිකන් පැද්දෙනවා වගේ දැනුණා. බස්එක ඇතුළ කළුවරයි. මම වම් අත තියලා බඩ ගාගෙන බස් එකේ ඉස්සරහට ආවා. එතකොට බස් එකේ හිටිය කෙනෙක් පොඩි ළමයෙක් උස්සාගෙන බඩගාගෙන වගේ ආවා. ළමයගේ අයිතිකාරයෙක් නෑ මේ ළමයා වඩා ගන්න කියලා එයා කිව්වා. එතකොට මම කිව්වා මගේ අත ගැලවිලා අත උස්සන්න බෑ කියලා. ළමයා ගැන මට හරි දුකක් ආවා. මම ඕම වාඩිවුණා. ළමයා උස්සාගෙන හිටි කෙනා දරුවා මගේ උකුලේ තිබ්බා. මම වම් අතින් ඒ ළමයා තුරුළු කරගත්තා. ටික ටික එළිය වැටිගෙන ආවා. මම වේදනාව පිටින් ළමයාව අඬන්න නොදී තුරුළු කර ගත්තා. නුවරඑළිය පැත්ත සීතල වුණත් මගේ උණුසුමට ළමයා මට ගුලි වෙලා හිටියා. විනාඩි 45ක් විතර මම එහෙම ඉන්න ඇති. පොලිසිය හා අහල පහළ පිරිස් ඇවිත් අපි පාරට අරන් ගියා. මමයි ළමයයි කොත්මලේ රෝහලට ගෙනාවා. මම කීවා මේ දරුවාගේ අම්මා හොයලා දෙන්න කියලා. ඒ අය දරුවා ගත්තා. පස්සෙ මමත් තව කිහිප දෙනකුයි ගිලන්රථවලින් ගම්පොල රෝහලට ගෙනාවා."

ඇගේ කතාව අසා සිටි ලියුම්කරුට ඇය නොදත් කතාවක සේයාරූ සිය කැමරා කාවයේ සටහන්ව ඇති බව වැටහුණි.

'ඊයේ ගම්පොළට ගෙනා ලෙඩ්ඩු අතර මේ කිරිදරුවත් හිටියා. අපි එයාගේ පින්තූරත් ගත්තා. ඒ ළමයා දැන් පේරාදෙණිය රෝහලට අරගෙන ගිහින් තියෙනවා. එයා හොඳින් ඉන්නවා කියලා රෝහලෙන් කිව්වා." ලියුම්කරු ඈට කීවේය.

''අනේ... ඒ ළමයා ඉන්නවාද? කොච්චර දෙයක්ද? මම ගොඩක් අමාරුවෙන් මා ගැනවත් හිතන්නේ නැතුව ඒ බබාව තුරුළු කරගෙන පරිස්සම් කරලා ගෙනාවේ. පෙරළුණු බස් එක ළඟ මම දරුවා වඩාගෙන ඉන්නකොට හැමෝම හිතුවේ ඒ දරුවා මගේ කියලා." ඈ කීවාය.

මෙම සිසුවියගේ මව වන සුරංගි රත්නායක මහත්මිය සහ ඇගේ සැමියා ද සිය දියණිය අසල අප යන මොහොතේ රැඳී සිටියහ. රත්නායක මහත්මිය මේ පිළිබඳව අපට මෙසේ පැවසුවාය.

"මට දුවලා දෙන්නෙක් ඉන්නවා. මෙයා ලොකු දුව. එයා විශ්වවිද්‍යාලයට යාමට පෙර මහනුවර කුණ්ඩසාලෙ කෘෂි තාක්ෂණ විද්‍යාලයට ඇතුල්වෙලා අවුරුදු තුනක් ඉගෙන ගත්තා. ඊට පස්සේ වයඹ විශ්ව විද්‍යාලයට තේරුණා. බස් එක පෙරළුණු දා රාත්‍රී මහත්තයා දුව එක්ක ගියා. බදුල්ලෙන් රාත්‍රී කොළඹ යන බස් එකේ බණ්ඩාරවලට ගිහින් එතනින් කතරගම බස් එකට දුව නඟිනවා. එදා බස් එක පරක්කු වෙලා ඇවිත් තියෙන්නේ. දුව බස් එකට දැම්මාම එයාගේ තව විශ්වවිද්‍යාල යාළුවෙක් වැලිමඩින් නඟිනවා. දෙන්නම යන නිසා අපට බයක් තිබුණේ නෑ. මහත්තයා දුව බස් එකට දාලා ආවට පස්සේ අපි නිදා ගත්තා. උදේ හතට විතර මට කෝල් එකක් ආවා. කතා කළ අය කීවා දුවහිය බස් එක අනතුරකට ලක්වෙලා දුවට කරදරයක් නෑ. කලබල නැතිව ගම්පොල රෝහලට යන්න කියලා. දැන් දුව ඉන්නේ කොත්මලේ රෝහලේ. ඒ සිද්ධියෙන් අපි කලබල වෙන නිසා ඒ කතා කරපු කෙනා ෆෝන් එක දුවටත් දුන්නා. දුව අපට කතා කරලා කිව්වා, අම්මා මට වෙන තුවාල නෑ අත තමයි ප්‍රශ්නයකට තියෙන්නේ කියලා."

ගම්පොල රෝහලට ඇතුළත් කර සිටි රෝහීන්ගේ සුවදුක් බැලීම සඳහා අගමැතිනි හරිනි අමරසූරිය මෙණෙවිය පෙරේදා (11) රාත්‍රී රෝහලට පැමිණ සිටියාය. ඇය සමඟ, සභා නායක බිමල් රත්නායක කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න, ප්‍රවාහන හා මහා මාර්ග නියෝජ්‍ය ඇමැති වෛද්‍ය ප්‍රසන්න ගුණසේන, සෞඛ්‍ය හා ජන මාධ්‍ය නියෝජ්‍ය ඇමැති වෛද්‍ය හංසක විජයමුණි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන තනුර දිසානායක සහ ෆස්මින් සරීෆ් මහත්වරුන්ද පැමිණ සිටියහ.

මෙහිදී අගමැතිවරිය මෙම සිසුවියගේ සුවදුක් විමසූ අතර ඇගේ උත්සාහය පිළිබඳව ස්තූතියද පළ කළහ.

ඡායාරූප - ගම්පොළ සමූහ - සුරංග දිල්හාන්

කොත්මලේ ගෙරඬිඇල්ලේදී සිදු වූ මාරක රිය අනතුරෙන් තුවාල ලබා රෝහල්ගතව ප්‍රතිකාර ලැබූවන්ගේ සුව දුක් බැලීමට අගමැතිනි හරිනි අමරසූරිය, ප්‍රවාහන මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා ඇමැති බිමල් රත්නායක, නියෝජ්‍ය ඇමැති වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහත්ම මහත්මිහු පෙරේදා (12) රාත්‍රියේ ගම්පොළ සහ පේරාදෙණිය රෝහල් වෙත පැමිණ තිබූ අයුරු.

ඡායාරූප - සුලෝචන ගමගේ , ගම්පොළ සමූහ - සුරංග දිල්හාන්

තුවාලකරුවන් බේරාගත් අසල්වැසියන්ගේ අදහස්

අනතුර සිදු වූ ස්ථානයේ පහන් දල්වමින්

මගේ ඇඟ පුරාම ලේ, මට මේක දරාගන්න බැරි වුණා

ධම්මික පුෂ්පකුමාර

ගම්පොළ - සුරංග දිල්හාන්

''මගේ ඇඟ පුරාම ලේවලින් නෑවිලා තිබුණා. මට මේක දරාගන්න බැරි වුණා. මම හවස ගෙදර ඇවිත් කඩේ ඉස්සරහට වෙලා හයියෙන් ඇඬුවා යැයි ගෙරඬිඇල්ලේ බස් අනතුරින් තුවාල ලැබූවන් බේරා ගැනීමට දායක වූ එම ප්‍රදේශයේ පදිංචි ධම්මික පුෂ්පකුමාර මහතා පැවසුවේය.

මෙම අනතුර ගැන අදහස් දැක්වූ ධම්මික පුෂ්පකුමාර මහතා මෙසේ ද පැවසීය.

"බස් එක පෙරළුණු තැන ඉඳලා මීටර් 400ක් විතර නුවරඑළිය ප්‍රධාන පාරේ මම සුළු කඩයක් කරනවා. පදිංචියත් එතනමයි. මේ ආරංචියත් එක්ක මම උදේ හයයි තිහට විතර එතැනට ගියා. ඒ වෙනකොටත් බස් එක ඇතුළේ මිනිස්සු හිරවෙලා එළියට එන්න බැරුව හිටියා. එළියේ හිටිය තුවාලකාරයෝ අරන් යනකම් අපි අහල පහල තිබුණු ග්‍රයින්ඩර් යකඩ ඉනි අරගෙන බස් එක ඇතුළට රිංගුවා. තහඩු, සීට් යකඩවලට මිනිස්සු හිරවෙලා. අපි ඒවා කප කපා ඒ අය එළියට ගත්තා. රියැදුරු මහත්තයා එයාගේ සීට් එක යට මැරිලා හිටියා. එක්කෙනෙක් ඇඟ උඩට බස් එකේ එන්පිම වැටිලා තිබුණා. එයා දෙකට කැඩිලා හිටියේ. එයාට යටවෙලා තවත් තුන් දෙනෙක් හිටියා. එයින් එක්කෙනකුට පණ තිබුණා. අපි මේ අය කොහොමහරි එළියට ගත්තා. තව එක්කෙනෙක් හිරවෙලා හිටියා. එයා අපට කීවා මගේ දරුවෝ තුන්දෙනයි බිරිඳයි ඉස්සරහ හිටියා ඒ අයට මොකද වුණේ කියලා බලන්න කියලා. එයා යකඩවලටයි, සීට්වලටයි, මළමිනීවලටයි හිරවෙලා. ඒ කතාව කිව්ව විදිහට මට ජීවිතේම එපා වුණා. අපි එයා ගන්න ගොඩක් මහන්සි වුණා. පැය එක හමාරකට විතර පස්සේ එයා බොහොම අමාරුවෙන් එළියට ගත්තා. ඒ විදිහට තුවාල අයයි මැරුණු අයයි පහළොවක් විතර අපි එළියට අරගෙන ආවා. කොත්මලේ ඕ.අයි.සී. මහත්තයයි පොලිසියේ අයයි අපට මේ වැඩේට සහාය දුන්නා. බස් එක ඇතුළේ තිබිලා මට හමුවුණු ෆෝන්, බෑග් මම ඕ.අයි.සී මහත්තයාට දුන්නා. තව ගෑනු කෙනෙක් උඩු අතට හිරවෙලා හිටියා. එයා ගන්ඩ යකඩ කපන්න වුණා. එතන හිර වෙලා තිබුණු යකඩේ අයින් කරලා තමයි ගන්න තිබුණේ. ඒ යකඩයක් කපනකොට ඒ ගිනි පුපුරු එයාගේ මූණට වැටෙන නිසා මම දාගෙන හිටිය කබාය ගලවලා එයාගේ මූණට දාලා ඒ යකඩ කපලා තමයි එයා එළියට ගත්තේ. මගේ ඇඟ පුරාම ලේ. මට මේක දරාගන්න බැරි වුණා. මම හවස ගෙදර ඇවිත් කඩේ ඉස්සරහට වෙලා හයියෙන් ඇඬුවා. මටත් ළමයි තුන්දෙනෙකුයි බිරිඳයි ඉන්නවා. මම ප්‍රාර්ථනා කළේ කාටවත් මේ වගේ දෙයක් වෙන්න එපා කියලා යැයි කීවේය.

ගෙරඬිඇල්ල ප්‍රදේශයේ පදිංචි චින්තක මහේෂ් මහතා අපට සිද්ධිය ගැන මෙසේ පැවසුවේය.

"උදේ පාන්දර අපට විශාල ශබ්දයක් ඇහුණා. ඒ එක්කම විලාප හඬක් ඇහුණා. ඒත් අපිට හොයාගන්න බැරි වුණා. අපි ගේ ළඟ හතර දෙනෙක් එකතු වෙලා ශබ්දය ඇහුණ දිහාට ගියා. අපට තේරුණා වාහනයක් පෙරළිලා කියලා. අපි ටෝච් අරගෙන අමාරුවෙන් පහළට බැහැලා බලනකොට බස් එකක් පෙරළිලා බව දැක්කා. බස් එකේ විසිවෙලා හිටිය අය මුලින්ම අපි පහළට අරන් ගියා උඩහට එන්න අමාරු නිසා. එතැන පහළ තිබුණේ රම්බොඩගම ඉස්කෝලෙ පිට්ටනිය. ටික වෙලාවකින් පොලීසියත් ආවා. සුවසැරිය ආවේ අටට විතර. මැරුණු අයයි පණ තියෙන අයයි කවුද කියලා බැලුවේ නෑ අහුවෙච්චි කෙනා අපි පහළ පිට්ටනියට ගෙනාවා. පස්සේ තව තව කට්ටිය එකතු වුණා. අපේ ඇඟවල් ලේවලින් නැහැවුණා. අපට ගෙවල්වල ඇවිත් කන්නවත් බැරි වුණා. අපේ කකුල් අතපය රිදෙන්න පටන් ගත්තා.

අනතුර සම්බන්ධයෙන් වසන්ති කුමාරි මහත්මිය මෙසේ කීවාය.

"බස් එක පෙරළුණු තැන රම්බොඩ නව ජනපදයේ තමයි මගේ අම්මා ඉන්නේ. එයා උදේ හතරයි හතළිස් නවයට මට කෝල් එකක් දීලා මේ අනතුර ගැන කීවා. මම ඉන්නේ ඊට පහළ. මම ඉක්මනට මේ ගැන කොත්මලේ පොලිස් ස්ථානාධිපති රත්නායක මහත්තයාට කෝල් කරලා කිවුවා. ඊට පස්සේ උදේ හයයි තිහට විතර මමත් එතනට යනකොට පොලීසියත් ඇවිත් හිටියා ගමේ ඔක්කොම එකතුවෙලා තුවාල වුණු අයයි මැරුණු අයයි එළියට ගත්තා. පස්සේ එකතු වුණ සිය ගණනක් මිනිස්සු කළේ මේවට උදවු කරනවා වෙනුවට ෆෝන්වලින් වීඩියෝ ෆොටෝ ගහපු එක විතරයි. මැරිලා හිටපු අය ඔතලා අරන් යන්න ගියා. ඒ විදිහට තුවාල අයයි මැරුණු අයයි පහළොවක් විතර අපි එළියට අරගෙන ආවා. කොත්මලේ ඕ.අයි.සී. මහත්තයයි පොලීසියේ අයයි අපට මේ වැඩේට සහාය දුන්නා. බස් එක ඇතුළේ තිබිලා මට හමුවුණු ෆෝන්, බෑග් මම ඕ.අයි.සී මහත්තයාට දුන්නා. තව ගෑනු කෙනෙක් උඩු අතට හිරවෙලා හිටියා. එයා ගන්ඩ යකඩ කපන්න වුණා. එතන හිර වෙලා තිබුණු යකඩේ අයින් කරලා තමයි ගන්න තිබුණේ. ඒ යකඩයක් කපනකොට ඒ ගිනි පුපුරු එයාගේ මූණට වැටෙන නිසා මම දාගෙන හිටිය කබාය ගලවලා එයාගේ මූණට දාලා ඒ යකඩ කපලා තමයි එයා එළියට ගත්තේ. මගේ ඇඟ පුරාම ලේ. මට මේක දරාගන්න බැරි වුණා. මම හවස ගෙදර ඇවිත් කඩේ ඉස්සරහට වෙලා හයියෙන් ඇඬුවා. මටත් ළමයි තුන්දෙනෙකුයි බිරිඳයි ඉන්නවා. මම ප්‍රාර්ථනා කළේ කාටවත් මේ වගේ දෙයක් වෙන්න එපා කියලා යැයි කීවේය.

ගෙරඬිඇල්ල ප්‍රදේශයේ පදිංචි චින්තක මහේෂ් මහතා අපට සිද්ධිය ගැන මෙසේ පැවසුවේය.

"උදේ පාන්දර අපට විශාල ශබ්දයක් ඇහුණා. ඒ එක්කම විලාප හඬක් ඇහුණා. ඒත් අපිට හොයාගන්න බැරි වුණා. අපි ගේ ළඟ හතර දෙනෙක් එකතු වෙලා ශබ්දය ඇහුණ දිහාට ගියා. අපට තේරුණා වාහනයක් පෙරළිලා කියලා. අපි ටෝච් අරගෙන අමාරුවෙන් පහළට බැහැලා බලනකොට බස් එකක් පෙරළිලා බව දැක්කා. බස් එකේ විසිවෙලා හිටිය අය මුලින්ම අපි පහළට අරන් ගියා උඩහට එන්න අමාරු නිසා. එතැන පහළ තිබුණේ රම්බොඩගම ඉස්කෝලෙ පිට්ටනිය. ටික වෙලාවකින් පොලීසියත් ආවා. සුවසැරිය ආවේ අටට විතර. මැරුණු අයයි පණ තියෙන අයයි කවුද කියලා බැලුවේ නෑ අහුවෙච්චි කෙනා අපි පහළ පිට්ටනියට ගෙනාවා. පස්සේ තව තව කට්ටිය එකතු වුණා. අපේ ඇඟවල් ලේවලින් නැහැවුණා. අපට ගෙවල්වල ඇවිත් කන්නවත් බැරි වුණා. අපේ කකුල් අතපය රිදෙන්න පටන් ගත්තා.

අනතුර සම්බන්ධයෙන් වසන්ති කුමාරි මහත්මිය මෙසේ කීවාය.

"බස් එක පෙරළුණු තැන රම්බොඩ නව ජනපදයේ තමයි මගේ අම්මා ඉන්නේ. එයා උදේ හතරයි හතළිස් නවයට මට කෝල් එකක් දීලා මේ අනතුර ගැන කීවා. මම ඉන්නේ ඊට පහළ. මම ඉක්මනට මේ ගැන කොත්මලේ පොලිස් ස්ථානාධිපති රත්නායක මහත්තයාට කෝල් කරලා කිවුවා. ඊට පස්සේ උදේ හයයි තිහට විතර මමත් එතනට යනකොට පොලීසියත් ඇවිත් හිටියා ගමේ ඔක්කොම එකතුවෙලා තුවාල වුණු අයයි මැරුණු අයයි එළියට ගත්තා. පස්සේ එකතු වුණ සිය ගණනක් මිනිස්සු කළේ මේවට උදවු කරනවා වෙනුවට ෆෝන්වලින් වීඩියෝ ෆොටෝ ගහපු එක විතරයි. මැරිලා හිටපු අය ඔතලා අරන් යන්න ගෙවල්වල තිබුණු ඇඳ ඇතිරිලි පවා අපි දුන්නා."

අනතුර සම්බන්ධයෙන් අදහස් දැක්වූ සාගර අභයවික්‍රම මහතා මෙසේ පැවසීය.

''මගේ පුතා නුවරඑළියේ වැඩ කරන්නේ. එයා වැඩට යන්න පාන්දර ඇහැරිලා හිටියේ. අල්ලපු ගෙදර මල්ලි කිවුවා වාහනයක් පෙරළුණා වගේ ශබ්දයක් ඇහුනා. මිනිස්සුත් කෑ ගහනවා බලන්න යමු කියලා. අපි අමාරුවෙන් පහළට බැහැලා බලනකොට මහා විනාශයක් වෙලා තිබුණේ. අපි හවස් වෙනකන් තුවාලකාරයෝයි මැරුණු අයයි ගත්තා."

ආර්.එම්. රණසිංහ මහතා මෙසේ පැවසීය.

මේ අනතුර සිදුවුණ තැනට එකතු වුණ දහස් ගණනක් මිනිස්සු උදවු කරනවා වෙනුවට කළේ ෆොටෝ ගහන එකයි වීඩියෝ කරන එකයි. ගමේ පිරිසයි වටපිටාවේ කිහිපදෙනෙක් තමයි මේ මළමිනී තුවාලකාරයෝ අරන් යන්න උදවු වුණේ. ඒ වගේම බස් එකට හිරවෙලා හිටිය අය ගන්න පැය ගණනාවක් මහන්සි වුණා."

මේ මහා ඛේදවාචකයෙන් මිනිසුන් විසි දෙකකට මරණය අත්කර දෙමින් හැටකට ආසන්න පිරිසකට ශරීර වේදනා ඇති කරමින් බස් රථය පෙරළී මහා විනාශයක් සිදුවිණි. එම මහා ඛේදවාචකය වූ ස්ථානයට රැස්වූ පිරිසක් උතුම් වෙසක් පොහොය දා අනිත්‍ය මෙනෙහි කර විපතට පත් වූවන්ට පින් පමුණුවීමේ අරමුණින් පහන් දැල්වූ අයුරු ද අපට දක්නට ලැබිණි.

ඒ.එම්. රණසිංහ

ධම්මික පුෂ්පකුමාර

සාගර

චින්තක මහේෂ්

අපට ගෙවල්වල ඇවිත් කන්නවත් හිත දුන්නෙ නෑ

චින්තක මහේෂ්

හිරවෙලා හිටිය අය ගන්න පැය ගණනාවක් මහන්සි වුණා

රණසිංහ

පස්සේ ආපු අය කළේ වීඩියෝ කරපු එක විතරයි

වසන්ති කුමාරි මහත්මිය